# 25 වන්දනා ගමන්

ප්‍රියාදර සැදැහැවතුනි,

මෙම වන්දනා ස්ථානයට ඔබ පැමිණියේ ආත්මික නවෝදය පතා ය. එබැවින්,

- ★ පවුලේ සැම සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලබා ගන්න.
- ★ දිව්‍ය පූජා යාගයට පූර්ණ ලෙස සහභාගි වී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගන්න.
- ★ භක්ති අභ්‍යාසවලට නොවරදවා සහභාගී වන්න.
- ★ ආචාරශීලි වන්න.
- ★ මෙම ස්ථානයේ පොදු නීතිරීතිවලට අවනත වන්න.
- ★ සංවර ඇඳුමෙන් සැරසී සිටින්න.
- ★ පොදු සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කරන්න.
- ★ මත්පැන් භාවිතයෙන් හා විනෝද වීමෙන් වළකින්න.
- ★ අන් අය හා සහයෝගයෙන් කටයුතු කරන්න.
- ★ නව මිනිසෙක් ලෙස ඔබේ මීසම, ගම හා පවුල වෙත පිය නගන්න.

ඔබ සැමට ජේසු පිහිටයි!

සිද්ධස්ථාන පාලක පියතුමා

මෙම දන්වීම් පුවරුව වන්දනා ස්ථානයක ගෞරවණීය බව සුරකිමින් හැසිරිය යුතු ආකාරය පිළිබඳ ව සැදැහැවත් ජනතාව දනුවත් කරයි.

එදිනෙදා ජීවිතයේ දී තම අවශ්‍යතා, යුතුකම්, වගකීම් හා අභියෝග හමුවේ පීඩාවට පත් ව සිටින සැවොම, තම ආත්මික සුවය පතා වන්දනා ගමන්වල නිරත වේ. එවැනි වන්දනා ගමන් මෙලොව සිට ස්වර්ගීය ජීවිතය කරා අප යන වන්දනා ගමන සිහිපත් කරවයි. එමෙන් ම දෙවි සමිඳුන් තුළ ජීවිත නවෝදය ප්‍රාර්ථනා කරන සැමට යාච්ඤාව තුළින් එම අත්දැකීම අත්කරගන්නට හිමි වන සුවිශේෂී අවස්ථාවකි.

## වන්දනා ගමන්වල පරමාර්ථ

- සැබෑ වූ එක ම දෙවියන් වහන්සේට පවුලක් හෝ සංඝයක් හෝ මීසමක් හෝ ලෙස වන්දනා කිරීමට
- දෙවි සමිඳුන්ගෙන් ලද සැම වරප්‍රසාදයකට ම තුති පුද කිරීමට
- තම ආත්මික හා ලෞකික අවශ්‍යතා දෙවිඳුන් හමුවේ තැබීමට
- වන්දනා ස්ථාන දැක බලා ගැනීමට
- එම ස්ථානයේ දී දෙවි පියාණන් වහන්සේගේ මහත් වූ ක්‍රියා තම ජීවිත අත්දැකීමක් කර ගැනීමට
- යාච්ඤාව හා ආධ්‍යාත්මික ප්‍රබෝධය තුළින් නව ජීවිතයක් ආරම්භ කිරීමට.

## මරුද මඩු දේවමාතා සිද්ධස්ථානය




25.1 රූපය - මරුද මඩු සිද්ධස්ථානය



25.2 රූපය - මරුද මඩු දේව මාතාවෝ

ලන්දේසීන්ගේ පීඩනය මන්නාරම් ප්‍රදේශය වෙත එල්ල වීමත් සමග එහි ජීවත් වූ කතෝලික බැතිමතුන්ට දුෂ්කරතා රැසකට මුහුණ දීමට සිදු විය. තම විශ්වාස තුළ ජීවත් වූ කතෝලික පවුල් 20ක් ක්‍රි.ව. 1670 දී තමන් සතු සියල්ල අතහැර දමා කන්ද උඩරට රජතුමාගේ පාලන ප්‍රදේශයට ගියෝ ය. එසේ ඔවුන් යන ගමනේ දී "මාන්තෙයි" ගම්මානයේ දේවස්ථානයක තැන්පත්කර

තිබූ ආශ්චර්යමත් දේව මාතාවන්ගේ ප්‍රතිමාව ද රැගෙන ගියහ. "මරුද මඩු" නමින් හැඳින්වෙන ගම්මානයකට පැමිණි ඔවුන් තම විශ්වාසය තුළ යාච්ඤාවෙන් කල් යැවූහ. එම ප්‍රදේශයට යාපනයේ සිට පළා ආ 700ක පමණ සැදැහැවතුන් පිරිසක් අතර හෙලේනා නම් තරුණියක් සිටියා ය. ඇය මරුද මඩුහි රේගුපොළේ සේවය කළ මහනුවර රජුගේ ප්‍රධාන නිළධාරියා සමග විවාහ වූවා ය. ඔහුගේ සහාය ඇති ව "මඩු මාතාවන්" වෙනුවෙන් මරුද මඩු ග්‍රාමයේ දේවස්ථානයක් ඉදිකළා ය.

අනතුරු ව ශුද්ධ වූ ජුසේ වාස් පියතුමන්ගේත් ගරු පියවරුන්ගේත් අතිඋතුම් රාජගුරුප්‍රසාදීන් වහන්සේලාගේත් මූලිකත්වයෙන් "මරුද මඩු දේවමාතා" සිද්ධස්ථානය සංවර්ධනය වී අද පවතින තත්ත්වයට පත් ව ඇත.

## තලවිල සාන්ත ආනා සිද්ධස්ථානය



25.3 රූපය - තලවිල සාන්ත ආනා සිද්ධස්ථානය



25.4 රූපය - සාන්ත ආනා තුමිය

දහඅටවන සියවස අගභාගයේ දී යුරෝපීය වෙළෙන්දකුට අයත් නෞකාවක් තලවිල වෙරළ තීරයට ආසන්නයේ දී මුහුදුබත් විය. සාන්ත ආනා මුනිතුමියගේ ප්‍රතිමාවක් එම නෞකාවේ තිබී ඇත. අනපේක්ෂිත මොහොතක සිදු වූ මෙම සිදුවීමේ දී නැවේ සිටි පිරිස තම දිවි ගලවා දෙන ලෙස එතුමියට කන්නලව් කර ඇත. ඔවුන් නිරුපද්‍රිත ව ගොඩබිමට ළඟා වූ අතර එහි ඔවුනට සෙවනක් සඳහා තිබුණේ නුග ගසක් පමණි. එහි බෙනයක වෙළෙන්දා ශුද්ධ වූ ආනා මුනිතුමියගේ ප්‍රතිමාව තැන්පත් කළේ ය. වෙළෙන්දා එතැනින් නික්මයාමට

පෙර එතුමියට තවත් බාරයක් වුයේ ය. එනම්, තමාගේ වෙළෙඳාම සාර්ථක වුවහොත් නැවත පැමිණ එතුමිය නමින් දෙව්මැදුරක් ඉදිකිරීමට ය. අනතුරු ව ඔහු ගාල්ලට ගියේ ය. ඔහුගේ වෙළෙඳාම සාර්ථක විය. ඔහු නැවත පැමිණ බාරය ඉටු කරමින් ගොඩනැගූ දෙව්මැදුර අද තිබෙන තත්ත්වයට වර්ධනය වී ඇත්තේ ශුද්ධ වූ ආනා මුනිතුමියගේ මැදහත්කම තුළ සිදු වූ ප්‍රාතිහාර්ය කරණ කොට ගෙන ය.

### තේවත්ත ලංකා අප ස්වාමි දුවගේ බැසිලිකාව



25.5 රූපය - තේවත්ත ලංකා අප ස්වාමි දුවගේ බැසිලිකාව



25.6 රූපය - ලංකා අප ස්වාමි දුවගේ ප්‍රතිමාව

දෙවන ලෝක සංග්‍රාමයේ දී කොළඹට හා ත්‍රිකුණාමලයට ජපන් ජාතිකයන් විසින් බෝම්බ හෙළන ලදි. මෙම භයානක තත්ත්වයෙන් අප මව්බිම මුදවා දුනහොත් "ලංකා අප ස්වාමි දූ" නමින් බැසිලිකාවක් ඉදිකරනා බවට තේවත්තේ පැරණි දෙව්මැදුර අසල ඇති පැරණි ලූර්දු ගුහාව අබියස දී එවකට අගරදගුරු ව සිටි අතිඋතුම් ජෝන් මේරි මසොන් (නි.ම.නි.) හිමිපාණන් බාරයක් වී ඇත. එම විශේෂ ප්‍රාර්ථනය ඉටු වූ බැවින් ශුද්ධාසනයේ අවසරය ගෙන මෙම බැසිලිකාව එතුමාණන්ගේ අනුප්‍රාප්තිකයා වූ අගරදගුරු අතිඋතුම් තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් විසින් ගොඩනගන ලදි.

## මාතර ජයලත් අප ස්වාමිදූගේ සිද්ධස්ථානය



25.7 රූපය - මාතර ජයලත් අප ස්වාමිදූගේ සිද්ධස්ථානය



25.8 රූපය - මාතර මෑණියන්ගේ ප්‍රතිමාව

වැලිගම ප්‍රදේශයේ ධීවරයන් පිරිසකට හමු වූ "මාතර ජයලත් අප ස්වාමි දූවගේ" ප්‍රතිමාව ඈඡ් වූඩ් ලීයෙන් නිර්මාණය වූවකි. අඟල් 26ක් උස ය. සුරලොව රාජිණියගේ විලාසය පෙන්නුම් කරනා මෙම ප්‍රතිමාව ඔවුහු මාතර දේවස්ථානය භාර ගරු පියතුමා වෙත බාර දී ඇත. මෙම ප්‍රතිමාව වසර 400කට වඩා පැරණි යයි සැලකේ. 2004 වර්ෂයේ දී සුනාමි උදම් රළපහරට ද හසු වූ මෙම ප්‍රතිමාව නැවත නිරුපද්‍රිත ව හමු විය. හාස්කම් රැසක අත්දකීම් අප වෙත ලබා දෙන මාතර අප ස්වාමි දූවගේ සිද්ධස්ථානයේ වාර්ෂික මංගල්‍යය දේවමාතාවන්ගේ උපන් මංගල්‍යය අළලා පවත්වනු ලබයි.

මෙම සිද්ධස්ථානය 1907 වර්ෂයේ දී ගරු ඒ. ක්ලොසෙට් (ජේසු නිකායික) පියතුමාගේ මූලිකත්වයෙන් ඉදි වූ බව සඳහන් වේ.

## ශුද්ධ වූ දේශය

ක්‍රිස්තුන් වහන්සේගේ උත්පත්තිය, ධර්මදූත සේවාව, දුක්විඳීම, කුරුසපත් වීම හා උත්ථානය මෙම භූමිය තුළ සිදුවීම නිසා ශුද්ධ වූ දේශය කතෝලික බැතිමතුන්ගේ වන්දනාමානයට පාත්‍ර වී ඇත.



25.9 රූපය - ශුද්ධ වූ දේශය

### පාදුවා



25.10 රූපය - පාදුවාහි බැසිලිකාව

ඉතාලියේ පාදුවා නගරයෙහි ප්‍රැන්සිස්කාන නිකායික ශුද්ධ වූ අන්තෝනි මුනිතුමන්ගේ ශුද්ධ වූ ධාතු මෙම බැසිලිකාවෙහි තැන්පත් කර ඇත. දේව වචනය අන් අය හා බෙදා ගැනීම සේ ම සත්‍යවාදී වීමේ ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ වූ අන්තෝනි මුනිතුමන්ගේ දිව තවමත් නොදිරා පවතී. නොදිරන ලද මෙම දිව ධාතුව කරඬුවක තබා මෙම බැසිලිකාවේ අල්තාරය පිටුපස මණ්ඩපයක තැන්පත් කර තිබේ. එමෙන් ම එතුමාගේ නිකට හා පහළ දත් ඇන්ද ද එතුමා භාවිත කළ තාපස ඇඳුම් ද ශරීරධාතු තැන්පත් කර තිබූ මිනීපෙට්ටිය ද මෙම බැසිලිකාවේ මහජන ගෞරවය සඳහා තබා ඇත. මෙම ශුද්ධ වූ වස්තු දැකබලා ගැනීමටත් එතුමාණන්ගේ මැදිහත්කම තුළ විශ්වාසයේ අත්දැකීම් ලබන්නටත් සුවිශාල බැතිමතුන් පිරිසක් ඉතාලියේ පාදුවා නගරයේ පිහිටි මෙම බැසිලිකා පුද බිමට නිරතුරු ව පැමිණෙති.

### ගෝව



25.11 රූපය - ගෝව නගරයේ බොම් ජේසු බැසිලිකාව

පුරාණ ගෝව නගරයේ පිහිටා ඇති "බොම් ජේසු" නම් බැසිලිකාවේ ශුද්ධ වූ ප්‍රැන්සිස් සේවියර් තුමන්ගේ නොදිරූ සිරුර තැන්පත් කර ඇත. එබැවින් මෙම ස්ථානය දැකබලා ගන්නට මෙන් ම ආත්මික නවෝදය පතා සැදැහැවත්හු මෙම ස්ථානය කරා පිය නගති.

ගෝව නගරය සැදැහැවතුන් අතර සුප්‍රසිද්ධ වීමට බලපෑ තවත් හේතුවක් නම් එය අප දේශයේ ධර්ම දූතයාණන් වූ ශුද්ධ වූ ජුසේ වාස් පියතුමාණන්ගේ නිජ බිම වීම ය.

මෙලෙස කිතුනු අපගේ වන්දනාමානයට පාත්‍රවන සිද්ධස්ථාන රැසක් දෙස් විදෙස් රටවල පවතියි. අපගේ ආත්මික සුවය පතා යදින්නට, දෙවිඳුන්ගේ මහත් ක්‍රියා අත්දකින්නට අප පියමං කරනා මෙම සිද්ධස්ථානවල ගෞරවය ආරක්ෂා වන සේ ක්‍රියාකිරීමට අප උනන්දු විය යුතු ය. එය අපගේ යුතුකමක් ද වන්නේ ය.

**ක්‍රියාකාරකම**

1. වන්දනා ස්ථානයක් කරා යාමේ පරමාර්ථ **තුනක්** නම් කරන්න.
2. වන්දනා ස්ථානයක පූජනීය බව සුරැකීමට අපට කළ හැකි ක්‍රියා **හතරක්** ලියා දක්වන්න.
3. ශුද්ධ වූ දේශය, පාදුවා හා ගෝව යන නගර කිතුනු අපගේ වන්දනාවට ලක්වන එක් හේතුව බැගින් දක්වන්න.



**ජීවිතයට බිඳක්**

***විනෝදය සඳහා නොව ආත්මික නවෝදය සඳහා වන්දනා ස්ථාන කරා පියනගන්න.***